# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1990 අංක 41 දරන

# පාරිතෝෂික ගෙවීම් (සංශෝධන) පනත

---

[යහනිකය සටහන් කළේ 1990 නොවැම්බර් මස 29 වන දින]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

---

1990 නොවැම්බර් මස 30 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිළ : ශත 45 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1990 අංක 41 දරන පාරිතෝෂික ගෙවීම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1990 නොවැම්බර් මස 29 වන දින]

එල්.ඩී.—ඕ. 54/89

**1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1990 අංක 41 දරන පාරිතෝෂික ගෙවීම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — *ලුහුඬු නාමය.*

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ 7 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර එම වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියේ 7අ, 7ආ සහ 7ඇ යන වගන්ති ලෙස බලාත්මක විය යුතු ය:— — *1983 අංක 12 දරන පනතට 7අ, 7ආ සහ 7ඇ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම.*

*"පොදු සමාගම් බවට පරිවර්තනය කරන ලද රාජ්‍ය සංස්ථා හෝ රජයට අයත් ව්‍යාපාර ආයතනවල සේවකයන්ට පාරිතෝෂික ගෙවීම.*

7අ. (1) 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ රජයට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ 2 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ වූ නියමයක් මගින් රාජ්‍ය සංස්ථාවක කාර්තව්‍ය පවරා ගැනීම සඳහා හෝ රජයට පවරාගත් ව්‍යාපාර ආයතනයක් පවරා ගෙන පවත්වා ගෙන යාම සඳහා හෝ සමාගමක් සංස්ථාගත කරනු ලැබූ අවස්ථාවක දී, එම සමාගමේ සේවකයන් බවට පත් වන්නා වූ ද එම නියමය ක්‍රියාත්මක වීමෙන් මේ පනත යටතේ යම් පාරිතෝෂිකයක් ලැබීමට හිමිකම් ලබන්නා වූ ද එම සංස්ථාවේ හෝ ව්‍යාපාර ආයතනයේ යම් සේවකයකුට, මේ පනතේ පෙරාතුව වූ විධිවිධාන වල කුමක් සඳහන් වුවද, එම පාරිතෝෂිකය මුදලින් හෝ ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නිකුත් කරනු ලබන බැඳුම්කර මගින් හෝ ගෙවනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කරනු ලැබූ සෑම බැඳුම්කරයකටම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන මධ්‍ය කාලීන රජයේ බැඳුම්කර වෙනුවෙන් තත් කාලයෙහි ගෙවනු ලබන්නා වූ පොලී අනුපාත අනුව පොලියක් නියම කර තිබිය යුතු අතර එම බැඳුම්කර—

(අ) 1087 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ රජයට පවරාගත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ 2 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ එම සමාගම සම්බන්ධයෙන් නියමයක් කරනු ලැබූ දින සිට අවුරුදු දහයක කාලයක් අවසන් වීමෙන් පසුව; හෝ

(ආ) එම සමාගමේ එවැනි සේවකයකුගේ සේවය (විශ්‍රාම යාම, මිය යාම, නීතිය ක්‍රියාත්මක වීම හෝ අන්‍යාකාරයකින්) අවසන් වීමේ දී ; හෝ

(ඇ) එවැනි සමාගමක කොටස් මුදල් විකිණීම සඳහා මහජනයා වෙත මුලින්ම ඉදිරිපත් කරනු ලැබූ දිනය

යන දිනවලින් කලින්ම එළඹෙන දිනයේ දී මුදල් බවට පරිවර්තනය කරනු ලැබිය යුතු ය.

(3) විකිණීම සඳහා ඉදිරිපත් කරනු ලැබූ සමාගමේ යම් කොටස් මුදලක් මිල දී ගැනීමේ කාර්ය සඳහා (1) වන උපවගන්තියේ සඳහන් කරනු ලැබූ යම් බැඳුම්කරයක් එහි කාලය අවසන් වීමට පෙර එය දරන්නා විසින් භාර දෙනු ලැබිය හැකි ය.

(4) එවැනි සෑම බැඳුම්කරයක්ම නියම කරනු ලැබිය හැකි ආකාරයට සහ නියම කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව නිකුත් කරනු ලැබිය යුතු ය.

රීති.

7ආ. නියම කරනු ලැබිය යුතු බවට මේ පනත රීති මගින් අවශ්‍ය යම් කරුණක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් රීති සාදනු ලැබිය හැකි ය.

ඇතැම් සමාගම්වල සේවකයිනට අදාළ විශේෂ විධිවිධාන.

7ඇ. රාජ්‍ය සංස්ථාවක කර්තව්‍ය පවරා ගන්නා වූ හෝ රජයට පවරාගත් ව්‍යාපාර ආයතනයක් පවරාගෙන පවත්වාගෙන යන්නා වූ හෝ සමාගමක සේවකයකු, මේ පනතේ 5(1) වන වගන්තියේ කාර්යයන් සඳහා ඒ සමාගමේ අවුරුදු පහක සේවය සම්පූර්ණ කර සිටි ද යන්න නිර්ණය කිරීමේ දී රාජ්‍ය සංස්ථාවෙහි හෝ රජයට පවරාගත් ව්‍යාපාර ආයතනයෙහි හෝ ඔහුගේ සේවා කාලය ඇතුළත් කරගනු ලැබිය යුතු ය.".

සංශෝධන අතීතයට බලපෑම.

3. මේ පනතේ ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනය 1987 මැයි මස 15 වන දින සිට ක්‍රියාත්මක වන ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.